# වෙළෙඳම හා සංචාරක කර්මාන්තය

## ජාත්‍යන්තර වෙළෙඳම

1994 වර්ෂයේ විදේශ වෙළෙඳාමෙහි කැපී පෙනෙන ප්‍රවණතාවය වන්නේ අපනයන ඉපැයීම්වල මධ්‍යස්ථ වර්ධනයට සාපේක්ෂව ආනයන වියදම්වල ඉහළ වර්ධනයක් දක්නට ලැබීමය. අපනයන වෙළෙඳ ද්‍රව්‍ය බොහොමයක ජාත්‍යන්තර මිළ ගණන් පහත වැටීම, අපනයන අංශයේ මධ්‍යස්ථ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවිය. 1993 වසරේ වූ සියයට 17 ක ( විගැහි දශලක්ෂ 299) කැපී පෙනෙන වර්ධනය සමඟ සසඳන කල 1994 වර්ෂයේ මුළු අපනයන ඉපැයීම් වර්ධනය වූයේ සියයට 9 කින් * හෙවත් විගැහි දශලක්ෂ 189 කිනි. 1994 වර්ෂයේදී කෘෂිකාර්මික, කාර්මික සහ ඛණිජමය යන ප්‍රධාන අපනයන සියල්ලෙහිම ඉපැයීම් ඉහළ නැගුණ නමුත් සියළු අංශවල වර්ධන වේගයන් 1993 වර්ෂයට වඩා බෙහෙවින් අඩුවිය. ආනයන වියදම 1993 වර්ෂයේ වූ විගැහි දශලක්ෂ 383 වර්ධනය හා සසඳන විට 1994 වර්ෂයේදී එය විගැහි දශලක්ෂ 458 කින් වැඩි විය. ආනයන වර්ධන වේගය සියයට 16 ක් වූ අතර එය 1993 වර්ෂයට බොහෝ දුරට සමාන විය. 1994 වර්ෂයේදී, සියළුම ප්‍රධාන ආනයන කාණ්ඩයන්හි වැඩිවීම් දක්නට ලැබුණ අතර, වඩාත් කැපී පෙනෙන වර්ධනයන් වාර්තා වූයේ ආයෝජන සහ පාරිභෝගික භාණ්ඩ ආනයනවලය. ආනයනයන්ට සාපේක්ෂව අපනයනයන්හි වර්ධන වේගය අඩුවීම නිසා 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 824 ක් වූ වෙළෙඳ හිඟය 1994 වර්ෂයේ දී විගැහි දශලක්ෂ 1,093 දක්වා විගැහි දශලක්ෂ 269 කින් වැඩිවිය. තාවකාලික රේගු දත්තයන්ට අනුව, 1994 වර්ෂයේ අපනයන ආදයම විගැහි දශලක්ෂ 2,237 (රුපියල් දශලක්ෂ 158,660) වූ අතර ආනයන වියදම විගැහි දශලක්ෂ 3,125 (රුපියල් දශලක්ෂ 221,527) විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1994 වර්ෂයේ වෙළෙඳ හිඟය විගැහි දශලක්ෂ 888 (රුපියල් දශලක්ෂ 62,867) විය. වාර්තා කිරීමේදී ඇති වන කාල පමාවන් සැළකිල්ලට ගෙන රේගු දත්තයන්හි අදල ගැලපීම් කළ පසුව, මුළු අපනයන සහ ආනයන වටිනාකම් පිළිවෙලින් විගැහි දශලක්ෂ 2,235 (රුපියල් දශලක්ෂ 158,554) සහ විගැහි දශලක්ෂ 3,328 (රුපියල් දශලක්ෂ 236,030) ක් විය. මෙසේ ගලපන ලද සංඛ්‍යාවන්ට අනුව 1993 වසරෙහි වෙළෙඳ හිඟය වූ විගැහි දශලක්ෂ 824 (රුපියල් දශලක්ෂ 55,375) සමඟ සසඳන විට 1994 වර්ෂයෙහි විගැහි දශලක්ෂ 1,093(රුපියල් දශලක්ෂ 77,476) විය.

1.46 සංඛ්‍යා සටහන

**විදේශීය වෙළෙඳමෙහි ක්‍රියාකාරිත්වය 1992 - 1994**

| වර්ෂය | වර්ධන අනුපාතිකය | | වෙළෙඳ දර්ශක (1985 - 100) | | අනුපාතය | |
|---|---|---|---|---|---|---|
| | අපනයන | ආනයන | අපනයන මිළ | ආනයන මිළ | වෙළෙඳ අනුපාතය | අපනයන/ ආනයන |
| 1992 | 20.3 | 11.2 | 211.2 | 237.0 | 89.1 | 0.70 |
| 1993 | 17.3 | 15.5 | 233.3 | 256.8 | 90.9 | 0.71 |
| 1994 (අ) | 9.2 | 16.0 | 234.1 | 270.4 | 86.6 | 0.67 |

(අ) තාවකාලික.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

සියළුම අපනයනයන්හි සාමාන්‍ය අපනයන මිළ ගණන් 1994 වර්ෂයේ වර්ධනය වූයේ සුළු වශයෙනි. සමස්ත අපනයන මිළ දර්ශකය රුපියල් වටිනාකම අනුව සියයට 0.3 කින් ඉහළ නැගුණ අතර එය, කෘෂිකාර්මික අපනයනයන්ගේ මිළ සියයට 0.7 කින් ඉහළ යෑමේද, කාර්මික අපනයනයන්ගේ මිළ සියයට 3.2 කින් පහළ යෑමේද, ඛණිජ අපනයනයන්ගේ මිළ සියයට 7.7 කින් ඉහළ යෑමේද ඒකාබද්ධ ප්‍රතිඵලයකි. සමස්ත ආනයන මිළ දර්ශකය රුපියල් වටිනාකම අනුව සියයට 5.3 කින් ඉහළ යාමක් වාර්තා කළ අතර එය ආයෝජන භාණ්ඩ, පාරිභෝජන භාණ්ඩ හා අන්තර් භාණ්ඩ පිළිවෙලින් සියයට 8.5 කින්, සියයට 6.8 කින් සහ සියයට 0.2

* විශේෂ වශයෙන් දක්වා නොමැතිනම් සියළුම ප්‍රතිශත වෙනස්වීම් විගැහි වටිනාකම් අනුව ගණනය කර ඇත.

කින් වැඩිවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස පිළිබිඹු වේ. මිළ ගණන්වල දක්නට ලැබුණ මෙම උපනතීන්හි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ අනුපාතය 1993 වර්ෂයේ පැවැති සියයට 2.0 ක වර්ධනය හා සැසඳීමේදී සියයට 4.7 කින් පහත වැටුණි.

### අපනයන

ගලපන ලද රේගු දත්තයන්ට අනුව, 1993 වර්ෂයේ අපනයන ඉපැයීම් විගැහි දශලක්ෂ 2,046 (රුපියල් දශලක්ෂ 138,175) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 2,235 (රුපියල් දශලක්ෂ 158,554) දක්වා සියයට 9 කින් වර්ධනය විය. කෘෂිකාර්මික, කාර්මික සහ ඛණිජමය යන සියළුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්හි ඉපැයීම්වල ඉහළයාම් වාර්තා විය. රෙදිපිළි සහ ඇඟළුම් (සියයට 7 කින්) සහ අතිකුත් කාර්මික අපනයන ඉපැයීම් (සියයට 21 කින්) වැඩිවීම නිසා 1994 වර්ෂයේ මුළු අපනයනයන්ගෙන් සියයට 74 කට දයක වූ කාර්මික අපනයන 1993 වර්ෂයට වඩා සියයට 11 කින් ඉහළ නැගුණි. මේ අතර කෘෂිකාර්මික අපනයන සියයට 4 කින් වැඩි වූයේ පොල් නිෂ්පාදිත (සියයට 29 කින්) සහ රබර් අපනයන (සියයට 11 කින්) වැඩිවීම නිසාය. 1993 වර්ෂයේ සියයට 20 ක් වූ ප්‍රශංසනීය වර්ධනය හා සසඳන විට 1994 වර්ෂයේ ඛණිජමය අපනයන ඉහළ නැගුනේ සියයට 11 කින් පමණි.

### තේ

1994 වසරේ මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 13 කට සහ කෘෂිකාර්මික අපනයන ඉපැයීම් වලින් සියයට 60 කට ද දයක වූ තේ තවදුරටත් කෘෂිකාර්මික අපනයන අතර ප්‍රධාන අපනයනය ලෙස පැවතුණි. තේ අපනයන ඉපැයීම් 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 295(රුපියල් දශලක්ෂ 19,911) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 296(රුපියල් දශලක්ෂ 20,964) දක්වා සුළු වශයෙන් වැඩි විය. මෙය අපනයන පරිමාව සියයට 5 කින් වැඩිවීමේ සහ අපනයනවල සාමාන්‍ය මිළ සියයට 4 කින් අඩුවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. තේ අපනයන සාමාන්‍ය මිළ විගැහි වටිනාකම් අනුව 1993 වර්ෂයේ කිලෝග්‍රෑමයකට විගැහි 1.35 (කිලෝග්‍රෑමයකට රුපියල් 91.16) සිට 1994 වර්ෂයේ කිලෝග්‍රෑමයකට විගැහි 1.29 (කිලෝග්‍රෑමයකට රුපියල් 91.32) දක්වා පහත වැටුණි. 1994 වර්ෂයේ තේ මිල පහත වැටීමට හේතු වූයේ ලෝක තේ සැපයුම වැඩිවීම, ප්‍රධාන පරිභෝජන රටවල ඉල්ලුමෙහි වර්ධනය හීනවීම, ගුණාත්මක තත්වයෙන් අඩු තේ වෙළෙඳපොළට සැපයීම වැනි හේතූන්ය. ජාත්‍යන්තර තේ වෙළෙඳපොළෙහි දක්නට ලැබුණු පිරිහීම කොළඹ තේ වෙන්දේසිය තුල ද විද්‍යාමාන විය. කොළඹ තේ වෙන්දේසියෙහි තේ කිලෝවක සාමාන්‍ය මිළ 1993 වර්ෂයට වඩා 1994 වර්ෂයේ දී සියයට 6 කින් පහත වැටිණි. මිළ පහත වැටීමේ නැඹුරුව, උස්බිම්, මැදිබිම් හා පහත්බිම් යන කාණ්ඩවල තේ සම්බන්ධයෙන් පොදුවේ දක්නට ලැබුණි. ඒ අතුරින්, වැඩිම බලපෑමකට ලක් වූයේ සියයට 9 කින් මිළ පහත වැටුණු මැදි බිම් තේ ය. උස්බිම් තේ මිළ සියයට 3 කින් පහත වැටුණු අතර, කොළඹ තේ වෙන්දේසියෙහි විකිණෙන මුළු තේ ප්‍රමාණයෙන් සියයට 50 ක් පමණ වන පහත් බිම් තේ මිළ සියයට 6 කින් පහත වැටුණි. 1994 වර්ෂයේ තේ මිළ පහත වැටීමේ බලපෑම සමස්තයක් වශයෙන් මුළු තේ අපනයන අංශයටම බලපෑවේය. මෙම තත්ත්වය සමහර තේ කර්මාන්තශාලාවල ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑ අතර, තේ කර්මාන්තශාලා හිමියන්ට තම කර්මාන්තශාලාවල ක්‍රියාකාරිත්වය යළි නංවාලීමට සහ තේ අපනයනකරුවන්ගේ විචල්‍ය පිරිවැය පියවා ගැනීම සඳහා තාවකාලික පිළියමක් ලෙස සහන පොළී අනුපාත මත විශේෂ මූල්‍ය පහසුකම් සපයන ලදී. තේ අපනයන පරිමාව 1993 වර්ෂයේ කිලෝග්‍රෑම් දශලක්ෂ 218 සිට 1994 වර්ෂයේ කිලෝග්‍රෑම් දශලක්ෂ 230 ක් දක්වා ඉහළ නැඟුන අතර එය ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා ගත වැඩිම තේ අස්වැන්නෙහි බලපෑම පිළිබිඹු කරයි. 1993 වරෂය හා සසඳන කළ 1994 වර්ෂයේදී ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවලට කරන ලද තේ අපනයන ප්‍රමාණය සියයට 51 කින් පමණ අඩුවීමේ බලපෑම, සිරියාව (සියයට 29 කින්), එක්සත් අරාබිය (සියයට 23 කින්), එක්සත් රාජධානිය සහ ඊජිප්තුව (සියයට 29 බැගින්) ඇතුළු අතිකුත් ප්‍රධාන තේ වෙළෙඳපොළවලට යවන ලද අපනයන වල වැඩිවීම නිසා මුළුමනින්ම සමහන් විය.

## රබර්

රබර් අපනයන ආදායම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 46 (රුපියල් දශලක්ෂ 3,086) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 51 ( රුපියල් දශලක්ෂ 3,582) ක් දක්වා සියයට 11 කින් වැඩි විය. මෙය ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඉහළ නැගුන ස්වභාවික රබර් මිළ පිළිබිඹු කරමින් රබර් අපනයනවල සාමාන්‍ය මිළ 1993 වසරේ කිලෝග්‍රෑමයකට විගැහි 0.66 (කිලෝග්‍රෑමයකට රුපියල් 44.34) සිට 1994 වසරේ කිලෝග්‍රෑමයකට විගැහි 0.73 (කිලෝග්‍රෑමයකට රුපියල් 51.81) දක්වා සියයට 11 කින් වැඩිවීමේ ප්‍රතිඵලයකි. ප්‍රධාන වශයෙන් රබර් නිපදවන රටවල් බොහොමයක දක්නට ලැබුණු නිෂ්පාදන අවහිරතා නිසා සමස්ත සැපයුමේ හිඟයක් ඇතිවීමත්, සමහර කාර්මික රටවල ආර්ථිකයන් යථා තත්වයට පත්වීමත් සමඟම ඇති වූ අධික ඉල්ලුමත් හේතුකොටගෙන රබර් මිළ ගණන් ඉහළයාමේ ප්‍රවණතාවය තවදුරටත් තීව්‍ර විය. රුසියාවේ කෘත්‍රිම රබර් නිෂ්පාදනය තියුණු ලෙස පහත වැටීම නිසා ස්වභාවික රබර්වලට වූ ඉල්ලුම වඩාත් ඉහළ නැඟුන අතර රබර් සැපයුමට අදාල වෙළෙඳ ගිවිසුම් අවලංගු කිරීම් සහ ඒ පිළිබඳ යළි සාකච්ඡා පැවැත්වීම් ආදී තත්ත්වයන් හමුවේ රබර් සඳහා දැඩි සමපේක්ෂණ ඉල්ලුමක් ඇතිවිය. ජාත්‍යන්තර රබර් සංවිධානයේ (International Natural Rubber Organisation) අතිරේක තොග කළමණාකරු (Buffer Stock Manager) 1989 වර්ෂයෙන් පසු ප්‍රථම වරට විකුණුම්කරුවෙකු වශයෙන් 1994 ජූලි මාසයේදී වෙළෙඳපොලට සිය තොග මුදාහැරීම මගින් මිළ ස්ථායීකරණය සඳහා මැදිහත් වූයේ ජාත්‍යන්තර රබර් සංවිධානයේ " මිළ ආදර්ශකය" "විකිණිය යුතු" මට්ටමට ඉහළ බැවිනි. අතිරේක තොග කළමණාකරු සතු මුළු තොගයම විකිණී අවසන් වුවද, 1994 සැප්තැම්බර් වන විට මිළ ඉහළ යෑම තවදුරටත් එසේම පැවතුණි. එසේ වුවද, ඉහළ නැඟුණ මිළ ගණන් වලින් උපරිම ඵල නෙලා ගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි වූයේ රබර් අපනයන පරිමාව 1993 වර්ෂයේ කිලෝග්‍රෑම් දශලක්ෂ 69.6 සිට 1994 වර්ෂයේ කිලෝග්‍රෑම් දශලක්ෂ 69.1 දක්වා පහත වැටීමේ හේතුවෙනි.

## පොල්

අපනයන පරිමාවේ කැපී පෙනෙන වර්ධනයක් පිළිබිඹු කරමින් පොල් අපනයන ඉපැයීම් 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 41 (රුපියල් දශලක්ෂ 2,796) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 53 (රුපියල් දශලක්ෂ 3,761) දක්වා සියයට 29 කින් වැඩිවිය. අපනයන පරිමාව ගෙඩි වශයෙන් ගණනය කළ විට 1993 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 293 සිට 1994 වර්ෂයේ ගෙඩි දශලක්ෂ 436 දක්වා සියයට 49 කින් වැඩි වූයේ 1993 වර්ෂයේ තිබූ යහපත් කාලගුණ තත්වයන්හි පසුකාලීන බලපෑම නිසාය. මේ අතර, පොල් ගෙඩියක සාමාන්‍ය අපනයන මිළ 1993 වර්ෂයේ ගෙඩියකට විගැහි 0.09 සිට 1994 වර්ෂයේ ගෙඩියකට විගැහි 0.08 දක්වා සියයට 11 කින් පහත වැටුණි. පොල් අපනයන මිළ (නැ. වි. ස) අඩුවීමට බොහෝදුරට බලපෑවේ ප්‍රධාන පොල් නිෂ්පාදිත රටවල ඉහළ නැගුණු නිෂ්පාදිතය හේතු කොට ගෙන ඇතිවූ අධි සැපයුමේ ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තර මිළ ගණන් පහත වැටීමය. කොහු කෙඳි සහ කොහු ගුදිරි ඇතුළු පොල්වල අතුරු නිෂ්පාදිත අපනයන වටිනාකමද 1994 වර්ෂයේ සියයට 28 කින් වැඩිවිය.

## සුළු කෘෂිකාර්මික අපනයන

1994 වර්ෂයේ සුළු කෘෂිකාර්මික අපනයන වටිනාකම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 86 (රුපියල් දශලක්ෂ 5,825) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 90 (රුපියල් දශලක්ෂ 6,385) දක්වා වැඩිවිය. 1994 වර්ෂයේදී, 1993 වර්ෂයට වඩා සුළු කෘෂිකාර්මික අපනයන නිෂ්පාදිතයන්හි සාමාන්‍ය මිල සියයට 33 කින් සැළකියුතු ලෙස පහත වැටීම නිසා අපනයන පරිමාව සියයට 57 කින් වැඩි වුවත්, අපනයන ඉපැයීම් වැඩිවූයේ සියයට 5 කින් පමණි. මුළු අපනයන ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස සුළු කෘෂිකාර්මික අපනයන ඉපැයීම් 1994 වර්ෂයේ දී සියයට 4 ක් වූ අතර එය 1993 වර්ෂයේ පැවැති වටිනාකම් ප්‍රමාණයට බෙහෙවින් සමාන විය. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අතුරින් අපනයන ඉපැයීම්වල කැපී පෙනෙන වැඩිවීම් වාර්තා වූයේ එළවළු, පළතුරු, පුවක්, කෝපි සහ තල අපනයන වලය. මීට ප්‍රතිවිරුද්ධව යමින්, ඉපැයීම්වල කැපී පෙනෙන අඩුවීම් දක්නට ලැබුණ අපනයන වන්නේ, කරාබු නැටි, බුලත්, කොකෝවා, සකස් නොකළ දුම්කොළ, කජු සහ ගම්මිරිස් යනාදියෙහිය. බුලත් සහ සකස් නොකළ දුම්කොළ වලින් ලත් ඉපැයීම් අඩුවූයේ අන්තර්ජාතික මිළ ගණන් පහත වැටීම නිසාය. අපනයන පරිමාව අඩු වීම නිසා අනිකුත් සුළු කෘෂිකාර්මික අපනයනයන්හි ඉපැයීම් ද පහත වැටුණි.

1.47 සංඛ්‍යා සටහන

## අපනයන, ආනයන සහ වෙළෙඳ තුලනය 1983 - 1994

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | රේගු සංඛ්‍යා | | | ගලපන ලද සංඛ්‍යා | | |
|---|---|---|---|---|---|---|
| | අපනයන (අ) නැ. වි. ස. | ආනයන(ආ) මි.ර.ගැ. | වෙළෙඳ තුලනය | අපනයන | ආනයන | වෙළෙඳ තුලනය |
| 1983 | 25,183<br>(1,001) | 42,021<br>(1,670) | -16,838<br>(-669) | 25,096<br>(998) | 45,558<br>(1,811) | -20,461<br>(-813) |
| 1984 | 37,006<br>(1,419) | 46,913<br>(1,799) | -9,908<br>(-380) | 37,347<br>(1,432) | 47,541<br>(1,823) | -10,194<br>(-391) |
| 1985 | 35,035<br>(1,268) | 49,069<br>(1,776) | -14,034<br>(-508) | 36,207<br>(1,311) | 54,049<br>(1,956) | -17,843<br>(-646) |
| 1986 | 34,092<br>(1,036) | 51,282<br>(1,559) | -17,189<br>(-523) | 34,072<br>(1,036) | 54,559<br>(1,658) | -20,487<br>(-623) |
| 1987 | 39,861<br>(1,046) | 59,750<br>(1,568) | -19,889<br>(-522) | 41,133<br>(1,080) | 60,528<br>(1,589) | -19,396<br>(-509) |
| 1988 | 47,092<br>(1,101) | 70,320<br>(1,645) | -23,228<br>(-543) | 46,928<br>(1,098) | 71,030<br>(1,661) | -24,102<br>(-564) |
| 1989 | 55,511<br>(1,202) | 75,353<br>(1,631) | -19,842<br>(-430) | 56,175<br>(1,216) | 80,225<br>(1,737) | -24,050<br>(-521) |
| 1990 | 76,624<br>(1,408) | 105,559<br>(1,940) | -28,936<br>(-532) | 76,624<br>(1,408) | 107,729<br>(1,980) | -31,105<br>(-572) |
| 1991 (ඇ) | 82,225<br>(1,453) | 127,831<br>(2,258) | -45,606<br>(-806) | 82,225<br>(1,452) | 126,643<br>(2,237) | -44,418<br>(-785) |
| 1992 (ඇ) | 107,509<br>(1,741) | 149,780<br>(2,425) | -42,272<br>(-685) | 107,855<br>(1,747) | 153,555<br>(2,487) | -45,700<br>(-740) |
| 1993 (ඇ) | 137,994<br>(2,043) | 181,381<br>(2,687) | -43,387<br>(-644) | 138,175<br>(2,046) | 193,550<br>(2,870) | -55,375<br>(-824) |
| 1994 (ඈ) | 158,660<br>(2,237) | 221,527<br>(3,125) | -62,867<br>(-888) | 158,554<br>(2,235) | 236,030<br>(3,328) | -77,476<br>(-1,093) |

(අ) ප්‍රති අපනයන වටිනාකම ඇතුළත්ය.
(ආ) සත රන් හා කාසි ඇතුළත් නොවේ.
(ඇ) සංශෝධිත.
(ඈ) තාවකාලික.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

## කාර්මික අපනයන

කාර්මික අපනයන ඉපැයීම් 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 1,646 (රුපියල් දශලක්ෂ 116,744) වූ අතර එය 1993 වර්ෂයේ වූ විගැහි දශලක්ෂ 1,487 ට (රුපියල් දශලක්ෂ 100,420) වඩා සියයට 11 ක වැඩිවීමකි. නිමි කාර්මික භාණ්ඩ අපනයනයන් වර්ධනය වීමට ප්‍රධාන පිටුබලය සැපයුනේ රෙදිපිළි හා ඇඟළුම් සහ අනිකුත් කාර්මික අපනයනයන් ඉහළ යාම මගිනි. රෙදිපිළි සහ ඇඟළුම් ඉපැයීම් 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 1,009 (රුපියල් දශලක්ෂ 68,150) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 1,080 (රුපියල් දශලක්ෂ 76,614) දක්වා සියයට 7 කින් වැඩි විය. 1993 වසරේ සියයට 17 ක වර්ධනයක් පෙන්නුම් කළ රෙදිපිළි සහ ඇඟළුම් අපනයන ඉපැයීම් 1994 වසරේදී අඩු වේගයකින් වර්ධනය වීමට යම් තරමකට හේතු වූයේ එක් අතකින් ඇමෙරිකා එක්සත් ජනපදය (ඇ. එ. ජ.) වෙතට ඇඟළුම් සලාක ක්‍රමයන් යටතේ අපනයනය කිරීම පිළිබඳව 1994 වර්ෂයේ අගභාගයේදී පැවති අවිනිශ්චිත තත්වයත් වූ අතර, අනෙක් අතින් අඩු මිළ ගණන්වල ඇඟළුම් වර්ග වැඩි වැඩියෙන් අපනයනය කිරීම ද වේ. සලාක යටතේ අපනයනය කරන යම් යම් වර්ගවල ඇඟළුම් අනුමත සලාක සීමාවන් ඉක්මවා අපනයනය කිරීම හේතුකොටගෙන, ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයන සඳහා වූ ප්‍රධානතම වෙළෙඳපොල වන ඇමෙරිකා එක්සත් ජනපදයට කරනු ලබන ඇඟළුම් අපනයනයන් කෙරෙහි 1994 වර්ෂයේ අවසන් භාගයේදී අහිතකර තත්වයක් උද්ගත විය. මේ තත්වය හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයන සඳහා ඇ. එ. ජ. විසින් වෙළෙඳ තහනමක් පැනවීමේ තත්වය මහහරවා ගැනීමේ උපක්‍රමයක් වශයෙන් ඇඟළුම් නැව්ගත කිරීම් කල් දැමීමට සිදුවන තත්වයක් පැන නැගුණි. රෙදිපිළි සහ ඇඟළුම් පිළිබඳ උරුගුවේ සාකච්ඡා වටයේ සම්මුතිය ක්‍රියාත්මක වීමත් ඒ අනුව ඇමෙරිකා එක්සත් ජනපද රෙදිපිළි ගිවිසුමට අදළ වාර්ෂික පදනම ලිත් වර්ෂයකට සමාන වන පරිදි වෙනස් කිරීමත් සමගම 1994 වර්ෂය අවසානයේදී මෙම අර්බුදය නිරාකරණය විය.

ඉහළ මට්ටමක දේශීය එකතුකළ වටිනාකමක් සහිත කාර්මික භාණ්ඩ දිරි ගැන්වීම තුලින් අපනයන ව්‍යුහය විවිධාංගීකරණය කිරීමෙහිලා පුළුල් ඉඩ ප්‍රස්ථා සැළසීමට අනිකුත් කාර්මික භාණ්ඩ අපනයනවලට හැකියාවක් ඇත. මෑතක සිට ආර්ථිකය තුල වර්ධනය වෙමින් පවතින අංශයක් ලෙස මෙම අපනයනවල වැදගත්කම ඉස්මතුව ඇත. 1994 වර්ෂයේ මුළු කාර්මික අපනයන ඉපැයීම් වලින් සියයට 31 ක් වූ අනිකුත් කාර්මික අපනයනයන්ගේ සමුච්චිත වටිනාකම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 422 (රුපියල් දශලක්ෂ 28,469) සිට විගැහි දශලක්ෂ 510 (රුපියල් දශලක්ෂ 36,171) දක්වා සියයට 21 කින් වැඩි විය. මෙම අපනයන කාණ්ඩයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ස්වර්ණාභරණ ( සියයට 96 කින් ), සම්, රබර්, කඩදසි, දැව සහ පිහන් භාණ්ඩ ( සියයට 33 කින්) , ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 29 කින්) සහ යන්ත්‍ර සූත්‍ර ,යාන්ත්‍රික සහ විදුලි උපකරණ (සියයට 19 කින්) යන අපනයනයන්ගෙන් ලත් ඉපැයීම්වල වැඩිවීමය. ඛණිජ තෙල් නිෂ්පාදන සහ දියමන්ති අපනයන වටිනාකම් බොහෝදුරට 1993 වසරේ පැවති මට්ටමෙහිම පැවතුණි.

## ඛණිජ ද්‍රව්‍ය අපනයන

ඛණිජ ද්‍රව්‍ය අපනයන ඉපැයීම් 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 54 (රුපියල් දශලක්ෂ 3,653) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 60 (රුපියල් දශලක්ෂ 4,293) දක්වා සියයට 11 කින් වැඩිවිය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මැණික් අපනයන ඉපැයීම් 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 50(රුපියල් දශලක්ෂ 3,402) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 55 (රුපියල් දශලක්ෂ 3,917) දක්වා සියයට 10 කින් වැඩිවීමය. අනිකුත් ඛණිජ ද්‍රව්‍ය අපනයන ඉපැයීම් විගැහි දශලක්ෂ 4 (රුපියල් දශලක්ෂ 251) සිට විගැහි දශලක්ෂ 5 (රුපියල් දශලක්ෂ 375) දක්වා මෙම කාලපරිච්ඡේද දෙක තුළ ඉහළ නැගුණ අතර එයට හේතු වූයේ ඉල්මනයිට්, ලෝපස් සහ යකඩ පයිරයිට්ස් අපනයන වැඩිවීමයි.

## ආනයන

ගලපන ලද රේගු සංඛ්‍යා අනුව මුළු ආනයන වියදම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 2,870 (රුපියල් දශලක්ෂ 193,550) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 3,328 (රුපියල් දශලක්ෂ

## 1.48 සංඛ්‍යා සටහන
## අපනයන සංයුතිය 1992- 1994

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු අපනයන වල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994(ඇ) | 1992 | 1993 | 1994 | 1992 | 1993 | 1994 |
| 1. කෘෂිකාර්මික අපනයන | 26,504 | 31,618 | 34,692 | 429 | 469 | 490 | 24.6 | 22.9 | 21.9 |
| 1.1 තේ | 14,893 | 19,911 | 20,964 | 241 | 295 | 296 | 13.8 | 14.4 | 13.2 |
| 1.2 රබර් | 2,960 | 3,086 | 3,582 | 48 | 46 | 51 | 2.7 | 2.2 | 2.3 |
| 1.3 පොල් | 3,691 | 2,796 | 3,761 | 60 | 41 | 53 | 3.4 | 2.0 | 2.4 |
| 1.3.1 පොල් මද නිෂ්පාදිත | 2,665 | 1,847 | 2,476 | 43 | 27 | 35 | 2.5 | 1.3 | 1.6 |
| 1.3.2 වෙනත් | 1,026 | 949 | 1,285 | 17 | 14 | 18 | 1.0 | 0.7 | 0.8 |
| 1.4 සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 4,959 | 5,825 | 6,385 | 80 | 86 | 90 | 4.6 | 4.2 | 4.0 |
| 2. කාර්මික අපනයන | 76,699 | 100,420 | 116,744 | 1,242 | 1,487 | 1,646 | 71.1 | 72.7 | 73.6 |
| 2.1 රෙදිපිළි හා ඇඟළුම් | 53,209 | 68,150 | 76,614 | 862 | 1,009 | 1,080 | 49.3 | 49.3 | 48.3 |
| 2.2 ඛනිජ තෙල් නිෂ්පාදිත | 2,771 | 3,801 | 3,959 | 45 | 57 | 56 | 2.6 | 2.7 | 2.5 |
| 2.3 වෙනත් | 20,719 | 28,469 | 36,171 | 336 | 422 | 510 | 19.2 | 20.6 | 22.8 |
| 3. ඛණිජමය අපනයන | 2,749 | 3,653 | 4,293 | 45 | 54 | 60 | 2.5 | 2.6 | 2.7 |
| 3.1 මැණික් | 2,482 | 3,402 | 3,917 | 40 | 50 | 55 | 2.3 | 2.4 | 2.5 |
| 3.2 වෙනත් | 267 | 251 | 375 | 4 | 4 | 5 | 0.2 | 0.2 | 0.2 |
| 4. වර්ග නොකළ අපනයන (ආ) | 1,903 | 2,484 | 2,825 | 31 | 36 | 39 | 1.8 | 1.8 | 1.8 |
| මුළු අපනයන (අ) (ආ) | 107,855 | 138,175 | 158,554 | 1,747 | 2,046 | 2,235 | 100.0 | 100.0 | 100.0 |

(අ) ගලපන ලදී.
(ආ) ප්‍රති අපනයන ඇතුළත්ය.
(ඇ) තාවකාලික.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

236,030) දක්වා සියයට 16 කින් වැඩි විය. සියළුම ප්‍රධාන ආනයන කාණ්ඩයන් තුළ මෙම වැඩිවීම පිළිබිඹු විය. ආනයන වියදම්වල උපරිම වැඩිවීම දක්නට ලැබුණේ 1993 වසරට වඩා සියයට 27 කින් හෙවත් විගැහි දශලක්ෂ 199 කින් 1994 වසරේදී ඉහළ නැගුණ ආයෝජන භාණ්ඩ කාණ්ඩය තුළය. මෙම කාලපරිච්ඡේදයන් දෙක අතර අන්තර් භාණ්ඩ ආනයන (සියයට 10 කින් හෙවත් විගැහි දශලක්ෂ 155 කින්)සහ පරිභෝජන භාණ්ඩ ආනයන (සියයට 17 කින් හෙවත් විගැහි දශලක්ෂ 94 කින්) ද වැඩි විය.

## පාරිභෝගික භාණ්ඩ

පාරිභෝගික භාණ්ඩ වියදම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 555 (රුපියල් දශලක්ෂ 37,371) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 650(රුපියල් දශලක්ෂ 45,983) දක්වා සියයට 17 කින් වැඩි විය. පාරිභෝගික භාණ්ඩ වියදම වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන වියදම සියයට 21 කින් ඉහළ යාමය. ආහාර සහ පාන වර්ග කාණ්ඩයේ ආනයන වියදම ද සියයට 13 කින් වැඩි විය. ආහාර සහ පාන වර්ග කාණ්ඩයේ ආනයන වියදම වැඩිවීමට ප්‍රධාන වශයෙන් දයක වූයේ සීනි, කිරි සහ කිරි නිෂ්පාදිත, මත්ස්‍ය නිෂ්පාදිත සහ ආහාර සහ පාන වර්ග කාණ්ඩයට අයත් වන අනිකුත් ආහාර ද්‍රව්‍ය අයත් කොටසේ ආනයන වියදම් ඉහළ යාමය. 1994 වසරේ ආහාර සහ පාන වර්ග කාණ්ඩයේ මුළු ආනයන වියදමෙන් සියයට 37 ක් වූ සීනි ආනයන වියදම 1993 වර්ෂයට වඩා 1994 වර්ෂයේ දී සියයට 50කින් වැඩිවිය. මෙය සීනි ආනයන පරිමාව සියයට 25 කින්ද, එහි සාමාන්‍ය ආනයන මිළ සියයට 20 කින්ද ඉහළයාමේ ඒකාබද්ධ ප්‍රතිඵලයයි. කිරි සහ කිරි නිෂ්පාදන ආනයන වියදම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 54 (රුපියල් දශලක්ෂ 3,656) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 61(රුපියල් දශලක්ෂ 4,305) දක්වා සියයට 12 කින් වැඩි වූ අතර කරවල ඇතුළුව මත්ස්‍ය නිෂ්පාදිතයන්හි ආනයන වියදම මෙම වසර දෙක අතර විගැහි දශලක්ෂ 36 (රුපියල් දශලක්ෂ 2,456) සිට විගැහි දශලක්ෂ 42(රුපියල් දශලක්ෂ 2,955) දක්වා සියයට 17 කින් වැඩිවිය. මෙබඳුම ඉහළ යාමේ උපනතියක් දක්වමින් අනිකුත් ආහාර ද්‍රව්‍ය වියදම ද 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 80(රුපියල් දශලක්ෂ 5,397) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 101(රුපියල් දශලක්ෂ 7,104) දක්වා සියයට 26 කින් වැඩිවිය. ආහාර සහ පාන වර්ග කාණ්ඩය තුල ප්‍රධාන අඩුවීම් වාර්තා වූයේ සහල් සහ පිටි ආනයන වියදම්වලය. සහල් ආනයන වටිනාකම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 35 (රුපියල් දශලක්ෂ 2,386) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 10 (රුපියල් දශලක්ෂ 655) දක්වා සියයට 73 කින් අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ දේශීය වී නිෂ්පාදිතය වැඩිවීම හේතුකොට ගෙන මෙම වර්ෂ දෙක අතර ආනයන පරිමාව මෙට්‍රික් ටොන් 208,806 සිට මෙට්‍රික් ටොන් 58,434 දක්වා අඩුවීමය. මේ අතර තිරිඟු පිටි ආනයනය 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 9 (රුපියල් දශලක්ෂ 552) සිට 1994 වර්ෂයේ ඉතාම සුළු මට්ටමක් දක්වා පහත වැටුණි.

කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ ආනයන කාණ්ඩයෙහි ඉහළ වර්ධන අනුපාතිකයන් වාර්තා වූයේ මෝටර් රථ, යතුරු පැදි සහ පාපැදි (සියයට 79 කින්), වෛද්‍ය සහ ඖෂධීය නිෂ්පාදිත(සියයට 26 කින්) , ගුවන් විදුලි යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර (සියයට 10 කින්) යන ආනයනයන්හිය. මීට වෙනස්ව යමින්, රබර් ටයර් සහ ටියුබ් සඳහා වූ ආනයන වියදම සියයට 34 කින් අඩු විය.

## අන්තර් භාණ්ඩ

1994 වර්ෂයේ අන්තර් භාණ්ඩ ආනයන වියදම විගැහි දශලක්ෂ 1,694 (රුපියල් දශලක්ෂ 119,970) ක්වූ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 10 ක වැඩිවීමකි. ප්‍රධාන වැඩිවීම් වාර්තා වූයේ, 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 617 (රුපියල් දශලක්ෂ 41,740) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 724 (රුපියල් දශලක්ෂ 51,299) දක්වා සියයට 17 කින් වැඩි වූ රෙදිපිළි සහ ඇඟළුම් ආනයනයන්හි සහ 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 46( රුපියල් දශලක්ෂ 3,108) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 56 ( රුපියල් දශලක්ෂ 3,885) දක්වා සියයට 21 කින් වැඩි වූ පොහොර ආනයනයන්හිය. ඉහළ ගිය ආනයන වියදම් වාර්තා වූ අනිකුත් අංශ වූයේ රසායනික ද්‍රව්‍ය සහ සංයෝජන (සියයට 9 කින්) ඩයි වර්ග, පදම් කිරීමට යොද ගන්නා සායම් වර්ග සහ අනිකුත් වර්ණක (සියයට 7 කින්) කඩදසි සහ ඝණ කඩදසි (සියයට 13 කින් ) සහ අනිකුත් අන්තර් භාණ්ඩ (සියයට 12 කින් ) ආදියයි. ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදිත සහ තිරිඟු ඇට ආනයන

වියදම් පිළිවෙලින් සියයට 12 කින් සහ සියයට 7 කින් අඩුවීම හේතුකොට ගෙන ඉහත දැක්වුණු ආනයන වියදම් ඉහළයාම්වල බලපෑම තරමක් දුරට සමනය විය. තිරිඟු ආනයන වියදම පහලයාමට මුළුමනින්ම හේතු වූයේ, තිරිඟු ඇට ආනයන පරිමාව සියයට 7 කින් වැඩිවීමේ බලපෑම සම්පූර්ණයෙන්ම කපා හරිමින් තිරිඟු ඇට ආනයන මිළෙහි සිදුවූ සියයට 18 ක පහත වැටීමයි. ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන වියදම අඩුවීමට එක් හේතුවක් වූයේ, බොරතෙල් ආනයන පරිමාව සියයට 8 කින් ඉහළ යාමේ බලපෑම සමනය කරමින් බොරතෙල් ආනයන මිළ සියයට 10 කින් පහළ යාමය.

## ආයෝජන භාණ්ඩ

ආයෝජන භාණ්ඩ ආනයන වියදම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 750 (රුපියල් දශලක්ෂ 50,508) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 949 (රුපියල් දශලක්ෂ 67,524) දක්වා කැපී පෙනෙන ලෙස සියයට 27 කින් වැඩි විය. ආයෝජන භාණ්ඩ කාණ්ඩයනට අයත් සියළුම උප කාණ්ඩයන්හි වියදම්වල ඉහළ නැඟීම් වාර්තා වූ අතර, වඩාත් තියුණු ලෙස ඉහළ නැඟුනේ ප්‍රවාහන උපකරණ සහ ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩයනට අයත් නොවන අනිකුත් ආයෝජන භාණ්ඩ කාණ්ඩයන්හිය. ප්‍රවාහන උපකරණ ආනයන වටිනාකම සියයට 40 කින් හෙවත් විගැහි දශලක්ෂ 89 කින්(රුපියල් දශලක්ෂ 7,413 කින්) වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, එයාර් ලංකා ගුවන් සේවයේ ගුවන් යානා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ විගැහි දශලක්ෂ 150 ( රුපියල් දශලක්ෂ 11,260) ක් වටිනා ගුවන් යානා දෙකක් ආනයනය කිරීමය. මෙම විශේෂ අයිතමයන් ඉවත් කොට සළකා බලන කළ 1994 වසරේ සමස්ත ප්‍රවාහන උපකරණ ආනයන වියදම සියයට 2 කින් වැඩි වූ අතර ඒ අනුව මුළු ආයෝජන භාණ්ඩ ආනයන වියදමෙහි වර්ධනය සියයට16 ක් විය. මේ අතර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සඳහා වූ අපනයන වියදම 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 332 (රුපියල් දශලක්ෂ 22,377) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 390 ( රුපියල් දශලක්ෂ 27,635) දක්වා සියයට 18 කින්ද, ගොඩනැගිළි ද්‍රව්‍ය ආනයන වියදම මෙම වසර දෙක අතර විගැහි දශලක්ෂ 138 (රුපියල් දශලක්ෂ 9,342) සිට විගැහි දශලක්ෂ 168 (රුපියල් දශලක්ෂ 11,898) ක් දක්වා සියයට 21 කින්ද වැඩිවිය. මුළු ආයෝජන භාණ්ඩ වියදමෙන් සියයට 8 ක්වූ අනිකුත් ආයෝජන භාණ්ඩ 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 78(රුපියල් දශලක්ෂ 5,566) දක්වා සියයට 40 කින් වැඩි විය.

1993 සහ 1994 යන වර්ෂ අතර ආනයන ව්‍යුහයේ වෙනස් වීමක් දක්නට ලැබුණි. සංඛ්‍යාත්මක වශයෙන් ආයෝජන භාණ්ඩ වියදමේ ප්‍රතිශතය සියයට 26 සිට සියයට 29 දක්වා වැඩි වූ අතර අන්තර් භාණ්ඩවල දයකත්වය සියයට 54 සිට සියයට 51 දක්වා අඩුවිය. එසේ වූවද ආයෝජන භාණ්ඩවලට ඇතුලත් වූ එයාර් ලංකා සමාගම ආනයනය කරන ලද ගුවන්යානාවල වටිනාකම් ඉවත්කොට සළකා බැලූ විට 1994 වසරේදී ආයෝජන භාණ්ඩවල දයකත්වය මුලු ආනයන වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 24 ක් ලෙස 1993 වසර හා සමානව පැවතුණි. පාරිභෝජන භාණ්ඩ කාණ්ඩයේ දයකත්වය නොවෙනස්ව සියයට 19 මට්ටමෙහිම පැවතුණි.

## විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය විවෘත වෙළෙඳාම මත පදනම් වූ අපනයනාභිමුඛ වර්ධන උපාය මාර්ගයන්ට අනුව තවදුරටත් හැඩ ගැසෙමින් පැවතුණි. මෙම සමස්ත ප්‍රතිපත්ති රාමුව තුළ අපනයන හා ආනයන සඳහා වූ බලපත්‍ර අවශ්‍යතාවයන් වැනි වෙළෙඳාමෙහි විෂමතාවයන්ට තුඩුදෙන අංගයන් ඉවත් කිරීමට පියවර ගන්නා ලදි. යම් යම් සුවිශේෂතා පිළිබඳ තත්ත්වයන් හැර, පොදුවේ සළකන කළ ආනයන සඳහා තීරු හතරකින් සමන්විත වූ බදු ව්‍යුහයක් පවත්වා ගෙන යන ලදි. සුළු ගණනක් වූ රාජ්‍ය භාර හා සෙස් බදු හැරුණු විට, අපනයන අංශය තවදුරටත් අපනයන බදු වලින් නිදහස්ව පැවතුණි. අපනයන ව්‍යුහය විවිධාංගීකරණය කිරීමේ හා අපනයනයන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණු ඇතිව මූල්‍යමය, රාජ්‍ය මූල්‍යමය සහ ආයතනික දිරිගැන්වීම් අපනයන අංශයට ලබාදීම 1994 වසර තුළද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

ජංගම ගිණුම හා සම්බන්ධ ජාත්‍යන්තර ගණුදෙනු මත වූ ගෙවීම් හා පැවරීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මකව පැවති සියළුම සීමා කිරීම් ඉවත් කිරීමත් සමඟම, ශ්‍රී ලංකාව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ව්‍යවස්ථාවලියෙහි 8 වෙනි ව්‍යවස්ථා විධිවිධානයන් පිළිගැනීමට 1994 මාර්තු මාසයේදී එකඟතාවය පළ කරන ලදී. විවෘත බහු පාර්ශ්වීය වෙළෙඳ ක්‍රමය විශ්ව ව්‍යාප්ත කරණය සඳහා වූ ක්‍රියාදමයකට ඒකාබද්ධ වීම සඳහා ශ්‍රී ලංකාවේ දැඩි අනුකූලතාව යළි ස්ථාපිත කරමින්, 1994 වර්ෂයේදී ශ්‍රී ලංකාව උරුගුවේ සාකච්ඡා වටයේ අවසාන පනත් කෙටුම්පතට සහ ලෝක වෙළෙඳ සංවිධානයේ (World Trade Organisation) සම්මුතියට අත්සන් තබන ලදී. කලාපයන් ඇතුළත රටවල් අතර, වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමෙහිලා කලාපීය වෙළෙඳ හවුල් වල වැදගත්කම ඉස්මතු වෙමින් පවතින වාතාවරණයක් තුළ, ශ්‍රී ලංකාව, දකුණු ආසියානු වරණීය වෙළෙඳ සම්මුතියේ (South Asian Preferential Trading Arrangement) හා බැංකොක් සම්මුතියේ සාකච්ඡා වටයන්ට අඛණ්ඩව සහභාගී විය. මීට අමතරව, විවිධ ද්විපාර්ශවීය සහයෝගිතා වැඩපිළිවෙල වලට සම්බන්ධ වීම තුළින් ශ්‍රී ලංකාව සිය වෙළෙඳ හවුල්කරුවන් සමඟ සමීප ආර්ථික සබඳතාවයන් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

## ආනයන හා අපනයන පාලනය

විදේශ වෙළෙඳම විවෘතකරණය කිරීමේ තවත් ඉදිරි පියවරක් ලෙස, 1994 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි අපනයන භාණ්ඩ වර්ග 7 ක් අපනයන බලපත්‍ර අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කරන ලදී. ඒ අනුව තවදුරටත් අපනයන බලපත්‍ර අවශ්‍ය වූයේ භාණ්ඩ වර්ග 4 ක් සඳහා පමණි. ඒවානම්, හුණු ගල් (කොරල්) හා බෙලි කටු, දැව හා දැව භාණ්ඩ, ඇත් දළ හා ඇත් දළ නිෂ්පාදිත සහ 1945 වර්ෂයට පෙර ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද මෝටර් රථ යනාදියටයි. ආනයන සම්බන්ධයෙන් ගත් කළ බලපත්‍ර අවශ්‍යතාවන්ගෙන් 1994 වර්ෂයේ දී නිදහස් කරන ලද භාණ්ඩ වන්නේ රතු පරිප්පු, සහල් ,ස්වර්ණාභරණ, නොකැපූ මැණික් ගල්, මූල්‍ය නොවන රන්, සමහර වර්ගයේ මෝටර් රථ හා ඩීසල් එන්ජින් ඇතුළුව සමහර භාණ්ඩයන්ය. කෙසේ වුවද, 1994 ජනවාරි මස අපනයන බලපත්‍ර අවශයතාවයන්ගෙන් නිදහස් කරන ලද බී ළූණු දේශීය ගොවීන්ට සපයන ආරක්ෂණයක් වශයෙන් 1994 ජුනි මස දී නැවත බලපත්‍ර යටතට ගෙන එන ලදී.

## තීරු ගාස්තු හා බදු

1993 නොවැම්බර් මස සිට ආනයනයන් මත පනවා තිබූ, සියයට 45, 35,20 හා 10 යන මූලික කාණ්ඩ සතරකින් යුත් තීරු හතරේ බදු ක්‍රමය 1994 වර්ෂය තුළදීද ක්‍රියාත්මක විය. කෙසේ වුවද, තීරු බදු ව්‍යුහය විධිමත් කිරීමෙහිලා සිදු කෙරෙමින් පවතින ක්‍රියාදාමය තුළ, බදු ක්‍රමයේ සරල බව සහ විනිවිද දැකිය හැකි බව යන අපේක්ෂිත අරමුණු වලට පටහැනි තත්ත්වයන් ද ක්‍රියාත්මකව පැවතුණි. ඒ අනුව, සමහර ආනයන තීරු හතරේ තීරු බදු ක්‍රමයට ඇතුළත් නොවීම සහ බොහෝ භාණ්ඩ සඳහා තීරු බදු සහන හා තීරු වලින් නිදහස් කිරීමේ අවසරයන් පිරිනැමීම ආදී තත්ත්වයන් 1994 වසර තුළදී දක්නට ලැබුණි. පූර්ණ වශයෙන් තීරු බදු නිදහස හිමිවූ භාණ්ඩ අතර, ට්‍රැක්ටර්, කෘෂිකාර්මික උපකරණ, ලිපිද්‍රව්‍ය, විදුලි ජනන යන්ත්‍ර, කෙඳි වර්ග, පරිප්පු, කරවල හා බලශක්ති උත්පාදන යන්ත්‍ර ආදිය වේ. මීට අමතරව, සම්පූර්ණ යොදය සහිත කිරිපිටි, සීනි, යොදය රහිත කිරිපිටි, රෙදිපිළි, නූල්, කෑමට ගන්නා තෙල් වර්ග හා සමහර ඉදිකිරීමේ උපකරණ ඇතුළු භාණ්ඩ කිහිපයක් සඳහා අර්ධ වශයෙන් තීරු බදු සහන ලබා දෙන ලදී.

අපනයන අංශය, 1994 වර්ෂයේදී සියළුම වටිනාකම මත අය කරනු ලබන අලෙවි බදු හා අපනයන තීරු බදු වලින් නිදහස් වූ අතර, සමහර අපනයන් මත සෙස් බදු හා රාජ්‍ය භාර යන බදු ක්‍රියාත්මකව පැවතුණි.

## නැව් ගාස්තු

1990 වර්ෂයේ දී නාවික සේවාවන් විවෘතකරණයත් සමඟ නැව් සමාගම් අතර ඇති වූ තරඟකාරීත්වය අඛණ්ඩ ලෙස වර්ධනය වීම හේතුකොටගෙන 1994 වර්ෂයේදී, නැව් සමාගම් රැසක් නාවික සේවාවට අවතීර්ණ වූ අතර, මෙය නැව් ගාස්තු පහත වැටීමට හේතු විය.

1.49 සංඛ්‍යා සටහන

## ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය 1992- 1994

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු අපනයන වල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994(අ) | 1992 | 1993 | 1994 | 1992 | 1993 | 1994 |
| 1. පාරිභෝගික භාණ්ඩ | 32,197 | 37,372 | 45,983 | 521.4 | 555.2 | 649.6 | 21.0 | 19.3 | 19.5 |
| 1.1 ආහාර සහ පාන වර්ග | 18,395 | 20,066 | 23,912 | 297.9 | 298.9 | 338.4 | 12.0 | 10.4 | 10.1 |
| 1.1.1 සහල් | 2,852 | 2,386 | 655 | 46.2 | 35.4 | 9.5 | 1.9 | 1.2 | 0.3 |
| 1.1.2 පිටි | 3 | 552 | 17 | 0.0 | 8.6 | 0.2 | 0.0 | 0.3 | 0.0 |
| 1.1.3 සීනි | 4,952 | 5,621 | 8,875 | 80.2 | 84.1 | 125.8 | 3.2 | 2.9 | 3.8 |
| 1.1.4 වෙනත් ආහාර | 10,588 | 11,507 | 14,365 | 171.5 | 170.8 | 202.9 | 6.9 | 6.0 | 6.1 |
| 1.2 වෙනත් | 13,802 | 17,306 | 22,071 | 223.5 | 256.5 | 311.2 | 9.0 | 8.9 | 9.4 |
| 2. අන්තර් භාණ්ඩ | 82,592 | 103,952 | 119,970 | 1,337.4 | 1,538.7 | 1,693.6 | 53.8 | 53.7 | 50.8 |
| 2.1 ඛණිජ තෙල් | 13,938 | 14,920 | 14,641 | 225.7 | 221.3 | 207.0 | 9.1 | 7.7 | 6.2 |
| 2.2 පොහොර | 2,366 | 3,108 | 3,885 | 38.3 | 46.1 | 55.6 | 1.5 | 1.6 | 1.6 |
| 2.3 රසායනික ද්‍රව්‍ය | 4,125 | 5,244 | 5,975 | 66.8 | 77.7 | 84.4 | 2.7 | 2.7 | 2.5 |
| 2.4 තිරිඟු | 4,549 | 5,609 | 5,178 | 73.7 | 83.2 | 73.0 | 3.0 | 2.9 | 2.2 |
| 2.5 රෙදිපිළි හා ඇඟළුම් | 33,552 | 41,740 | 51,299 | 543.3 | 616.9 | 723.6 | 21.9 | 21.6 | 21.7 |
| 2.6 වෙනත් | 24,062 | 33,331 | 38,992 | 389.6 | 493.5 | 550.0 | 15.7 | 17.2 | 16.6 |
| 3. ආයෝජන භාණ්ඩ | 37,294 | 50,508 | 67,524 | 603.9 | 750.0 | 948.8 | 24.2 | 26.1 | 28.6 |
| 3.1 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 17,098 | 22,377 | 27,635 | 276.9 | 331.5 | 389.6 | 11.1 | 11.6 | 11.7 |
| 3.2 ගමනා ගමන උපකරණ * | 7,889 | 15,012 | 22,425 | 127.7 | 224.1 | 312.8 | 5.1 | 7.8 | 9.5 |
| 3.3 ගොඩනැගිලි ද්‍රව්‍ය | 7,936 | 9,342 | 11,898 | 128.5 | 138.3 | 168.0 | 5.2 | 4.8 | 5.0 |
| 3.4 වෙනත් | 4,371 | 3,777 | 5,566 | 70.8 | 56.1 | 78.4 | 2.8 | 2.0 | 2.4 |
| 4. වර්ග නොකරන ලද | 1,472 | 1,718 | 2,553 | 23.9 | 26.1 | 36.0 | 1.0 | 0.9 | 1.1 |
| මුළු ආනයන (ආ) | 153,555 | 193,550 | 236,030 | 2,486.6 | 2,870.0 | 3,328.0 | 100.0 | 100.0 | 100.0 |

(අ) තාවකාලික.
(ආ) ගලපන ලද.
* 1993 සහ 1994 ආනයනය කරන ලද ගුවන් බස් වටිනාකම් ද ඇතුළත්වේ.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව,
ලංකා පොහොර සමාගම හා
වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ,,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
ශ්‍රී ලංකා මහබැංකුව.

නිෂ්පාදිත හා ගමනාන්ත පදනම මත එක්සත් රාජධානිය හා ප්‍රංශයට තේ අපනයන සඳහා වූ නැව් ගාස්තු සියයට 10 කින් පමණ පහත වැටුණු අතර, ජපානය, සිංගප්පූරුව, සෞදිඅරාබිය, කුවේටය හා නැගෙනහිර කැනඩාව සඳහා වූ එම නැව් ගාස්තු නොවෙනස්ව පැවතිණි. එක්සත් රාජධානිය, යුරෝපය (එක්සත් රාජධානිය හැර), මධ්‍යධරණී රටවල් හා ප්‍රංශයට යවන ලද ඇඟළුම්, කපා සකස් කරන ලද පොල් හා රබර් අපනයනය සඳහා වූ නැව් ගාස්තු වසර තුළදී අඛණ්ඩව පහත වැටුණි. මීට වෙනස් ව යමින්, ප්‍රධාන වශයෙන් බන්කර් ගාස්තු ඉහළ යාම හේතුවෙන් ඇමෙරිකා එක්සත් ජනපදයට යවන ලද තේ හා ඇඟළුම් අපනයන සඳහා වූ නැව් ගාස්තු වල ඉහළ යාමක් දක්නට ලැබුණු අතර, ඇමෙරිකා එක්සත් ජනපදයට යැවුණු අනිකුත් සියළුම වෙළෙඳ භාණ්ඩ සඳහා වූ නැව් ගාස්තු 1993 වර්ෂයේ පැවැති මට්ටමෙහිම පැවතුණි.

## අපනයන දිරිගැන්වීම්

සමස්ත ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ ප්‍රධාන අංශයන් අතරට ගැනෙන අපනයන අංශයට 1994 වර්ෂය තුළදී ද මූල්‍ය, රාජ්‍ය මූල්‍ය හා ආයතනමය දිරිගැන්වීම් අඛණ්ඩව ලබා දෙන ලදි.

පළාත් මට්ටමෙන් නිෂ්පාදනය පුළුල් කිරීමේ හා ව්‍යවසායකත්වය දියුණු කිරීමේ අරමුණු ඇතිව 1994 වර්ෂයේදී අපනයන සංවර්ධන මණ්ඩලය මගින්, අපනයනයට නැඹුරු වූ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා සහාය ලබාදීමේ වැඩපිළිවෙලක් හඳුන්වා දෙන ලදි. කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීම, වෙළෙඳපොළ සංවර්ධනය, නිෂ්පාදිත භාණ්ඩ සංවර්ධනය හා මූල්‍යමය දිරිගැන්වීම්, අවශ්‍ය තොරතුරු ලබාදීම හා අපනයනකරුවන් සඳහා වූ අනිකුත් පොදු උපකාරක සේවාවන් සැළසීම මෙම වැඩපිළිවෙලෙහි අරමුණ විය.

සම්ප්‍රදායික නොවන අපනයන අංශයෙහි සුළු හා මහා පරිමාණ අපනයනකරුවන්ට සහායවීම සඳහා මූල්‍යමය ආධාර සැපයීමේ යෝජනා ක්‍රම අපනයන සංවර්ධන මණ්ඩලය මගින් 1994 වර්ෂය තුළදී ද පවත්වාගෙන යන ලදී. විමසුමට භාජනය වන වසර තුළදී රබර් නිෂ්පාදන, අත්යන්ත්‍ර හා රෙදිපිළි නිෂ්පාදන, පළතුරු, එළවළු, මල් හා විසිතුරු පැල අපනයනයන් සඳහා දිරිගැන්වීම් යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී.

රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් අතර, 1994 වර්ෂය තුළදීද තීරු බදු ප්‍රතිදාන යෝජනා ක්‍රමය, බන්ධිත නිෂ්පාදන ගුදම් ක්‍රමය හා බදු නිදහස් භාණ්ඩ ප්‍රතිෂ්ඨාපනය වැනි යෝජනා ක්‍රම ක්‍රියාත්මක විය. තීරු බදු ප්‍රතිදාන ගෙවීමේ ක්‍රියාමාර්ගය සරල කිරීමේ හා එහිදී ඇතිවන ප්‍රමාදයන් අවම කිරීමේ අරමුණ ඇතිව දැනට ක්‍රියාත්මකව පවතින ආනයනික අමුද්‍රව්‍ය සඳහා බදු නිදහස ලබාදීමේ යෝජනා ක්‍රමයන්ට වෙනස්කම් කිහිපයක් සිදු කිරීම පිළිබඳව 1994 වසර තුළ නැවත සලකා බලන ලදි.

අපනයන සංවර්ධන මණ්ඩලය මගින් අපනයන ක්‍රියාමාර්ගයන්, අලෙවිය, ඇසුරුම් ක්‍රම හා තාක්ෂණික ක්‍රම දියුණු කිරීම මගින් නිෂ්පාදිතයන්හි තත්ත්වය ඉහළ නැංවීම ආදී කරුණු සම්බන්ධයෙන් අපනයනකරුවන්ගේ දැනුම පුළුල් කිරීමට ඉවහල් වන්නාවූ දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ හා වැඩ මුළු සංවිධානය කිරීම ඇතුළු පුළුල් ක්ෂෙත්‍රයක් තුළ පැතිර ගිය සේවාවන් රැසක් සලසන ලදි. මීට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලය මගින් තෝරා ගත් අපනයනකරුවන්ට විදේශීය වෙළෙඳ ප්‍රදර්ශන හා වෙළෙඳ සල්පිල් වලට සහභාගීවීම සඳහා පහසුකම් සලසන ලදි.

1994 ඔක්තෝබර් මස ශ්‍රී ලංකාවේ පවත්වන ලද, දෙවන ජාත්‍යන්තර වෙළෙඳ සල්පිල වන " එක්ස්පෝ - 94" තුළින් ශ්‍රී ලංකා අපනයනකරුවන්ට ජාත්‍යන්තර වෙළෙඳපළ හා සම්බන්ධිත අත්දැකීම් පුළුල් කර ගැනීමේ මහඟු අවස්ථාවක් සැලසුණි. ආනයනකරුවන් 350 කට වැඩි පිරිසක් "එක්ස්පෝ - 94" ට සහභාගි වූ අතර, රටවල් 42 ක විදේශීය ගැණුම්කරුවන් හා ආයෝජකයන් 1,732 කට ආසන්න පිරිසක් එයට සහභාගී විය. මෙම සල්පිල, දළ වශයෙන් රුපියල් දශලක්ෂ 142 ක් වටිනා ස්ථිර අපනයන ඇණවුම් ශ්‍රී ලංකාවට ලබාදීමට සමත් විය.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (ශ්‍රී. ලං. අ. ණ. ර. ස.) ද බැංකු ඇපකර නිකුත් කිරීම හා අපනයන රක්ෂණ යෝජනා ක්‍රම ලබාදීම මගින් 1994 වසර තුළ දී අපනයනකරුවන්ට සහාය විය. නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 474 ක් දක්වා පස් ගුණයකටත් වඩා වැඩි වූ අතර, එම රක්ෂණ ඔප්පු වල වටිනාකම 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 1971 ක් දක්වා සිව් ගුණයකින් වර්ධනය විය. නිකුත් කරන ලද බැංකු ඇපකර සංඛ්‍යාව 1993 වර්ෂයේදී 430 සිට 1994 වර්ෂයේදී 1,133 දක්වා දෙගුණයකටත් වඩා වැඩි වූ අතර, එම ඇපකර වල වටිනාකම 1993 වර්ෂයේ රුපියල් දශලක්ෂ 650 සිට 1994 වර්ෂයේ රුපියල් දශලක්ෂ 3,429 දක්වා සිව් ගුණයකටත් වඩා වැඩි විය.

විදේශිය වෙළෙඳ ප්‍රදර්ශන හා වෙළෙඳ සල්පිල් වලට සහභාගිවන මැණික් හා ස්වර්ණාභාරණ අපනයනකරුවන් සඳහා සෘජු ඇපකර යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම මගින්, 1994 වර්ෂයේදී දි ශ්‍රී. ලං. අ. ණ. ර. ස. සිය සේවාවන් තව දුරටත් ව්‍යාප්ත කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී. ල. අ. ණ. ර. ස. මගින් විදේශීය වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගිවන අපනයනකරුවන් හට ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ, ශ්‍රී ලංකා ජාතික සභාව මගින් නිකුත් කරන සිය භාණ්ඩ තීරු බදු රහිතව අදාළ වෙළෙඳපළවල් වෙතට ගෙනයාම සඳහා අවසර ලබාදෙන පිළිගත් සහතිකයක් (ඒ. ටී. ඒ. කාර්නට්) ඇප සුරැකුම් රහිතව ලබාගැනීමට සහාය වේ.

## 1.50 සංඛ්‍යා සටහන
## 1994 වර්ෂයේ ප්‍රධාන ආනයනයන්හි පරිමාව

මෙට්‍රික් ටොන්

| මාසය | සහල් | තිරිඟු | සීනි | ඛනිජතෙල් (බොරතෙල්) | පොහොර |
|---|---|---|---|---|---|
| ජනවාරි | 24,146 | 92,317 | 37,367 | 187,802 | 31,990 |
| පෙබරවාරි | 12,744 | 52,466 | 62,804 | 185,160 | 23,786 |
| මාර්තු | 426 | 32,939 | 26,450 | 130,300 | 43,654 |
| අප්‍රේල් | 2,300 | 52,964 | 47,528 | 180,023 | 58,502 |
| මැයි | 2,095 | 104,202 | 54,258 | 182,768 | 40,427 |
| ජූනි | 7,310 | 101,487 | 45,168 | 183,935 | 60,014 |
| ජූලි | 4,699 | - | 54,014 | 58,279 | 42,191 |
| අගෝස්තු | 350 | 109,901 | 52,221 | 182,217 | - |
| සැප්තැම්බර් | 85 | 111,840 | 27,731 | 123,632 | 28,755 |
| ඔක්තෝබර් | 201 | 101,774 | 14,001 | 182,715 | 16,575 |
| නොවැම්බර් | 2,348 | 2,060 | 23,001 | 238,632 | 25,465 |
| දෙසැම්බර් | 1,730 | 64,407 | 46,457 | 62,258 | 55,158 |
| එකතුව (අ) | 58,434 | 826,357 | 491,000 | 1,897,721 | 426,517 |

(අ) ගලපනලදී.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව,
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව,
ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව,
ලංකා පොහොර සමාගම සහ වෙනත්,
ප්‍රධාන පොහොර ආනයන කරුවෝ.

## වෙළෙඳ සැකසුම් සහ වෙළෙඳ සම්බන්ධතා

ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන රැසක් සමඟ ක්‍රියාකාරී ලෙස සහභාගීවීම මගින් ජාත්‍යන්තර වෙළෙඳම සහ ආර්ථික සහයෝගීතාව තවදුරටත් වර්ධනය කර ගැනීමට ශ්‍රී ලංකාව කටයුතු කරන ලදී. තීරු බදු සහ තීරු බදු නොවන වෙළෙඳ බාධක අඩුකර ගැනීමත් ජාත්‍යන්තර වෙළෙඳාමෙහි නීතිරීති සහ මූලධර්ම වඩාත් ශක්තිමත් කිරීමත් තුළින් වෙළෙඳාම පුළුල් වීමේ වාසි අත්පත් කර ගැනීම අරමුණු කොට ගෙන, තීරු බදු සහ වෙළෙඳම පිළිබඳ පොදු සම්මුතිය යටතේ පවත්වන ලද බහු පාර්ශ්වීය වෙළෙඳ සාකච්ඡා මාලාවේ අට වැනි සැසිවාරය වූ උරුගුවේ සාකච්ඡා වටයෙහි අවසාන පනත් කෙටුම්පතට, 1994 අප්‍රේල් 15 වන දින ශ්‍රී ලංකාව අත්සන් තබන ලදී. තීරු බදු සහ තීරු බදු නොවන බාධක අඩු කිරීමට අවශ්‍ය පියවර ගැනීම නිසා පමණක් නොව, තීරු බදු සහ වෙළෙඳම පිළිබඳ පොදු සම්මුතිය සමඟ රෙදිපිළි සහ ඇඟළුම් අංශය ඒකාබද්ධ කිරීම ද ඇතුළු කෘෂි නිෂ්පාදිත සහ සේවා වෙළෙඳාම, වෙළෙඳාම හා සම්බන්ධ ආයෝජන උපාය මාර්ග, බුද්ධිමය දේපළ අයිතීන් ආදී කරුණු ද ඇතුළත්ව පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය වන බැවින්, උරුගුවේ වෙළෙඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධයෙන් අතිශයින්ම වැදගත් වන්නකි. උරුගුවේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම නිසා ඇතිවන තීරු බදු වෙනස්කම් අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සඳහා සැළකිය යුතු ලෙස වාසිදායක වන තත්ත්වයක් හිමිවනු ඇත. යෝජිත තීරු බදු වෙනස්කම් සම්බන්ධයෙන් වෙළෙඳාම හා තීරු බදු පිළිබඳ පොදු සම්මුතිය මගින් කරන ලද විමර්ශනයකට හා අගැයුමකට අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සඳහා වූ තීරුබදු වල බර තැබූ සාමාන්‍යයන් ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ ජපානය යන වෙළෙඳපලවල් සඳහා පිළිවෙලින් සියයට 7 කින් , සියයට 21 කින් සහ සියයට 56 කින් අඩුවනු ඇති බවට ඇස්තමේන්තු කර ඇත. එසේ වුවද, තීරු බදු වල පොදුවේ සිදුවන අඩුවීම් නිසා, දියුණු වෙමින් පවතින රටවල් අතර පවතින කලාපීය වෙළෙඳ හවුල් ඇතුළත දැනට භුක්ති විඳින වරණීය තීරු බදු අනුපාතිකයන් සහ පොදු තීරු බදු අනුපාතිකයන් අතර පරතරය අඩුවීම හේතුකොටගෙන, කලාපීය වෙළෙඳ හවුල් වශයෙන් ඒකාබද්ධ වීමේ වැදගත්කම අඩුවිය හැක. උරුගුවේ සම්මුතියට කෘෂි නිෂ්පාදිත වෙළෙඳාම ඇතුළත් කිරීම නිසා, විශේෂයෙන් තිරිඟු සහ තිරිඟු පිටි, කිරි නිෂ්පාදිත, සීනි සහ සහල් ආදී වෙළෙඳ ද්‍රව්‍යයන්හි මිළ ගණන් වැඩිවීම නිසා ශ්‍රී ලංකාව වැනි ආහාර ද්‍රව්‍ය ආනයන කරන දියුණු වෙමින් පවතින රටවලට කෙටි හා මැදි කාලීන වශයෙන් අයහපත් ප්‍රතිඵල ඇතිවනු ඇත. උරුගුවේ සාකච්ඡා වටයේදී වෙළෙඳාම සම්බන්ධයෙන් සම්මත කරගනු ලැබූ පියවරයන් ක්‍රියාත්මක වීමත් සමඟම, රෙදිපිළි සහ ඇඟළුම් පිළිබඳව ජාත්‍යන්තර වෙළෙඳාම පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ද්විපාර්ශ්වික සලාක ක්‍රමයක් මත පදනම්ව 1974 වසරේ ඇති කර ගන්නා ලද බහුවිධ කෙඳි වර්ග පිළිබඳ ගිවිසුමේ ක්‍රියාකාරිත්වය 1995 වර්ෂයේ සිට වසර 10 කාලයක් තුළ පියවරෙන් පියවර නිමාවට පත්වේ. එබැවින් සලාක ක්‍රමය ඉවත් කිරීමෙන් පසුව අනාගතයේදී ඇතිවන තරඟකාරිත්වයට මුහුණ දීමට හැකිවන අයුරින් ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තයේ නිෂ්පාදන ධාරිතාව හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීමට තරම් ප්‍රමාණවත් වන කාලයක් මේ මගින් ලැබෙනු ඇත. බහු විධ කෙඳි වර්ග පිළිබඳ ගිවිසුම යටතේ 1994 දෙසැම්බර් මස 31 දිනට පැවති සලාක සීමාවන් 1995 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි උරුගුවේ සම්මුතියෙහි රෙදිපිළි සහ ඇඟළුම් පිළිබඳ නව ගිවිසුමට ඇතුළත් වෙයි.

උරුගුවේ සාකච්ඡා වටයෙහි අවසන් නීති කෙටුම්පතෙහි සඳහන් නීති රීති හා මූලධර්මයන්ට අනුව යමින් ජාත්‍යන්තර වෙළෙඳම පිළිබඳව නව ලෝක රටාවෙහි ක්‍රියාකාරිත්වය සුපරීක්ෂා කිරීමේ බලය පැවරී ඇති "ලෝක වෙළෙඳ සංවිධානය" පිළිබඳ ගිවිසුමට 1994 ජුනි මස පළමුවෙනි දින ශ්‍රී ලංකාව අත්සන් තබන ලදී.

දකුණු ආසියානු වරණීය වෙළෙඳ ගිවිසුමෙහි ආරම්භක සාමාජිකයෙකු වශයෙන්, ශ්‍රී ලංකාව, කලාපයේ සාමාජික රටවල් අතර අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ වෙළෙඳම හා සම්බන්ධ විවිධ සහනදායී පියවරයන් මගින් කලාපීය වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් පවත්වන ලද සාකච්ඡාවන්ට ක්‍රියාකාරී ලෙස සහභාගී විය. මේ යටතේ 1994 අප්‍රේල් මාසයේදී, වෙළෙඳම විවෘත කිරීම පිළිබඳව වූ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ සිව්වන රැස්වීමේදී ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී. මෙහිදී, සාමාජික රටවල් අතර වෙළෙඳ තොරතුරු සහ ඒ ඒ රටවල් විසින් බදු සහන ලබාදීමට යෝජිත භාණ්ඩ පිළිබඳ අවශ්‍යතා ලැයිස්තු පිළිබඳව

අවසන් නිගමනයන්ට එළඹීමට හැකි විය. ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ලැයිස්තුව, වෙළෙඳාම සහ තීරු බදු පිළිබඳ ජනාධිපති කොමිසමෙහි උපදෙස් අනුව පිළියෙල කරන ලද අතර, එය, පකිස්ථානය හැර ගිවිසුමට සම්බන්ධ අනෙකුත් සියලුම රටවල් වෙතට ඉදිරිපත් කරන ලදි. 1994 වසරේදී අනිකුත් සාමාජික රටවල් අතුරින් බංග්ලාදේශයේ අවශ්‍යතා ලැයිස්තුව ශ්‍රී ලංකාව වෙත ලැබී තිබුණි.

වෙළෙඳම පිළිබඳ වරණයන්ගේ පොදු ක්‍රමය (G.S.T.P.) යටතේ බදු සහන සහිතව අදළ වෙළෙඳපොළවල් වෙතට භාණ්ඩ යැවීමේ පහසුකම 1994 වසර තුළදී ද ශ්‍රී ලංකාවට හිමි විය. ඒ ඒ රටවල් සඳහා වෙන් වෙන්ව සලකනු නොලබන්නාවූත්, ප්‍රතික්‍රියා දැක්වීමේ කොන්දේසි මත පදනම් නොවන්නාවූත්, පොදු ක්‍රමයක් වූ මෙම වරණීය ක්‍රමය දියුණු වෙමින් පවතින රටවල ආර්ථික වර්ධනය වේගවත් කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙනු වස් 1968 වර්ෂයේදී ආරම්භ කරන ලද වැඩපිළිවෙලකි. මෙම ක්‍රමය යටතේ ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය, ඕස්ට්‍රේලියාව, කැනඩාව සහ යුරෝපීය කොමිසම ඇතුළු දියුණු රටවල් 26 ක් විසින් විවිධ යෝජනා ක්‍රම 16 ක් 1994 වර්ෂය අවසානය වනවිට ක්‍රියාත්මක කරමින් පැවතුණි. එසේ වුවද, උරුගුවේ සම්මුතියේ නීතිරීති වලට අනුගත වීමට සහ ඉතාමත් අඩු දියුණු රටවල් සඳහා වඩා පුළුල් පදනමකින් සහන සැලසීමද අරමුණු කොටගෙන යුරෝපීය කොමිසම විසින් 1994 දෙසැම්බර් මාසයේ දී සංශෝධිත වරණීය පොදු ක්‍රමයක් ප්‍රකාශයට පත් කරණ ලදී. මෙම නව ක්‍රමය යටතේ කෘෂි නිෂ්පාදිතයන්ට අදල යෝජිත වෙනස්කම් ක්‍රියාවට නැංවීම ඇරඹෙන්නේ 1996 වසරේ සිට වන අතර එමගින් ශ්‍රී ලංකාවේ කෘෂි අපනයන සහා මූලික වෙනස්කම් සිදු නොවනු ඇත. පැරණි ක්‍රමය යටතේ මෙන්ම මෙම නව ක්‍රමය යටතේද, ශ්‍රී ලංකාවේ කාර්මික අපනයනයන් සඳහා පැවති විවිධ සීමාවන් තවදුරටත් පවතිනු ඇත. උදාහරණයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ රෙදිපිළි අපනයන සඳහා දේශීය අමුද්‍රව්‍ය පදනමක් නොමැතිවීම නිසා යුරෝපීය කොමිසමේ රටවල් වෙතට ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ඇඟළුම් සඳහා අවාසිදායක තත්ත්වයක් පවතී. සංශෝධිත වරණීය පොදු ක්‍රමය අනුව යුරෝපා කොමිසමේ රටවලට කෙරෙන ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන් 1995 ජනවාරි සිට බලපාන පරිදි අමතර ගාස්තුවකට යටත් වනු ඇත. මෙම අමතර ගාස්තුව දැනට උපරිම වරප්‍රසාදිත ජාතින් (Most Favoured Nations) යටතේ ප්‍රදනය කරනු ලබන තීරුබදු අනුපාතයන්ගෙන් සියයට 85 කට සමානය. සංශෝධිත වරණීය පොදු ක්‍රමයට අනුව සහන ලබාදිම තීරණය වන්නේ එ ඒ රටවලට මෙන්ම ඒ ඒ නිෂ්පාදිතයන්ට ද සුවිශේෂ වූ තත්ත්වයන් මත පදනම්ව සළකා බැලීමෙනි. වාණිජ දෙපාර්තමේන්තුව විසින් අදළ වෙළෙඳ අංශ ද සමඟ සාකච්ඡා කොට ශ්‍රී ලංකාවේ අපනයන කෙරෙහි යෝජිත වරණීය පොදු ක්‍රමයේ බලපෑම පිළිබඳව අධ්‍යයනය කොට ඒ පිළිබඳව 1994 වසරේදී යුරෝපා කොමිසම වෙත නියෝජිත මට්ටමින් කරුණු ඉදිරිපත් කරණ ලදි.

බලශක්ති, පාරිසරික, ආයෝජන සහ කාර්මික සහයෝගීතාව යන ක්ෂේත්‍රයන්හි යෝජනා ක්‍රම සඳහා පහසුකම් සැළසීම අරමුණු කොටගෙන, යුරෝපා කොමිසම සහ ශ්‍රී ලංකාව අතර හවුල් ව්‍යාපාර සහ සංවර්ධනය පිළිබඳ නව සහයෝගිතා ගිවිසුමකට 1994 ජුලි මාසයේදී අත්සන් තබන ලදි. මේ අතර, 1994 වර්ෂයේ පැරණි සහයෝගිතා ගිවිසුම යටතේ දැනට ක්‍රියාත්මක වන හා ක්‍රියාත්මක කිරීමට සියලු කටයුතු සම්පාදනය කොට ඇති යෝජනා ක්‍රම ඒ අයුරින්ම ක්‍රියාත්මක වනු ඇත. නව සහයෝගිතා ගිවිසුම යටතේ යුරොපීය කොමිසම වෙත ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘතීන් පිළිබඳව යෝජනා ලබාගැනීමට 1994 වසර තුල අවශ්‍ය කටයුතු සම්පාදනය කරණ ලදි.

ශ්‍රී ලංකාව වෙළෙඳ වරණයන් සඳහා වූ පොදු ගිවිසුමෙහි ද (Generalised System of Trade Preferences) සාමාජිකයෙකි. මෙම වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ගිවිසුමේ දෙවන සාකච්ඡා වටයේදී, තීරුබදු අඩුකිරීම හා තීරුබදු නොවන අනිකුත් වෙළෙඳ බාධක ඉවත් කිරීම මගින් දියුණු වෙමින් පවතින සාමාජික රටවල් සඳහා වෙළෙඳපලවල් වෙතට ඇතුල්වීමේ ඉඩකඩ ලබාදෙන ලදි. වෙළෙඳාම සහ තීරුබදු පිළිබඳ ජනාධිපති කොමිසමේ සහ අදළ පෞද්ගලික අංශයන්හී උපදෙස් මත මීට අදළ ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ලැයිස්තු සකස් කරනු ලැබූ අතර එම ලැයිස්තු සාමාජික රටවල් දහඅටක් වෙත ඉදිරිපත් කරණ ලදි. මීට අයත් සාමාජික රටවල් නවයකින් එබඳුම අවශ්‍යතා ලැයිස්තු ශ්‍රී ලංකාව වෙත ඉදිරිපත් කරණ ලද අතර, 1994 වසර තුළදී සාමාජික රටවල් දහතුනක් සමඟ මේ පිළිබඳව මූලික ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදි.

ශ්‍රී ලංකාව, වෙළෙඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ (U.N.C.T.A.D.) සහ ස්වභාවික රබර් නිපදවන රටවල සංවිධානයේ ද සාමාජිකයෙකි. මීට අමතරව, මුලින් පැවති කෝපි ගිවිසුම වෙනුවට නව කෝපි ගිවිසුමක් ඇතිකර ගැනීමසඳහා 1994 වසර තුළදී සාකච්ඡා පැවැත්වුණි. මෙම නව ගිවිසුමෙහි අපනයන සලාක වැනි ආර්ථිකමය විධිවිධාන ඇතුලත් නොවන අතර ශ්‍රී ලංකාව මීට අත්සන් නොකිරීමට තීරණය කරණ ලදි.

ශ්‍රී ලංකාව බැංකොක් සම්මුතියෙහිද සාමාජිකයෙක් වන අතර, මෙම සම්මුතියේ අරමුණ වන්නේ අන්‍යෝන්‍ය වශයෙන් සහන ලබාදීම තුලින් සාමාජික රටවල් අතර වෙළෙඳාම දියුණු කිරීමය. මේ යටතේ ශ්‍රී ලංකාවේ සමහර අපනයන සඳහා විශේෂිත තීරු බදු සහන ලබාදීම් වශයෙන් වාසි සැළසෙන අතර ඉන්දියාව, බංගලාදේශය, ලාඕසය, කොරියානු සමූහාණ්ඩුව සහ පැපුවා නිව්ගිනියාව යන සාමාජික රටවල් වෙතින් එවනු ලබන ආනයන සඳහා ශ්‍රී ලංකාව මගින් එබඳුම සහන පිරිනමනු ලබයි. 1994 වසරේදී ඉන්දියාව විසින් උපරිම වරප්‍රසාදිත ජාතීන්ගේ (Most Favoured Nations) ක්‍රමය යටතේ ලබාදෙන බදු අනුපාත අඩුකිරීම හේතුකොටගෙන බැංකොක් සම්මුතිය යටතේ ප්‍රදානය කරන ලද ඇතැම් තීරු බදු වල වැදගත්කම හීනවූ අතර ශ්‍රී ලංකාව මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු, ඉන්දියාව විසින් බැංකොක් සම්මුතියෙන් ආවරණය වන නිෂ්පාදිතයන්ට අදල වරණීය බදු අනුපාත සංශෝධනය කරණ ලදි.

ආර්ථික සහයෝගීතාව සහ වෙළෙඳාම නංවාලීමේ මාර්ගයක් වශයෙන් ද්විපාර්ශ්වික සහයෝගීතාවත් පවත්වා ගැනීම ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම ප්‍රතිපත්තියේ මූලික අංගයක් වේ. දැනට පවතින ද්විපාර්ශ්වික සහයෝගිතා ගිවිසුම් යටතේ 1994 වසර තුළ ඉන්දියාව,චීනය ඉරානය, පකිස්ථානය, රුමේනියාව, බංග්ලාදේශය, මාලදිවයින, ඊජිප්තුව හා තුර්කිය සමඟ ඒකාබද්ධ කමිටු නවයක් පවත්වන ලදි. 1994 අප්‍රේල් මාසයේදි කුවේට් රාජ්‍යය සමඟ නව වෙළෙඳ ගිවිසුමකට ද ශ්‍රී ලංකාව අත්සන් තැබීය.

## අභ්‍යන්තර වෙළෙඳාම

1994 වර්ෂය තුළ අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් යොමු වූයේ පාරිභෝගික ආරක්ෂණය තහවුරු කිරීම අරමුණු කොටගෙනය. වෙළෙඳ අක්‍රමිකතා ඉවත් කිරීම සහ භාණ්ඩවල තත්ත්වය නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වා ගැනීමට අවශ්‍ය වන විශේෂිත අවශ්‍යතා නිසි පරිදි අනුගමනය කරනු ලබන්නේද යන්න විමර්ශනය කිරීම ආදි කටයුතු මගින් අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව 1994 වර්ෂය තුළ සිය කාර්යයන් මෙහෙයවන ලදි. මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත විමධ්‍යගත කිරීම නිසා අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දෙපාර්තමේන්තුවේ කාර්යයන් තරමක් දුරට සීමා විය. මෙම තත්වයට පිළියම් යෙදීමේ උත්සාහයක් වශයෙන් 1994 වර්ෂයේ ජූලි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ වෙළෙඳ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල නැවත පිහිටුවීමට කැබිනට් තීරණයක් ගන්නා ලදී.

පාරිභෝගික ආරක්ෂණ පනතෙහි විධිවිධානයන් යටතේ, ගිනිකුරු නිෂ්පාදන කර්මාන්තය සඳහා නියමිත ශ්‍රී ලංකා ප්‍රමිති අවශ්‍යතා පවත්වා ගැනීමත්, ගිනිපෙට්ටි ලේබලයන් මත විශේෂිත තොරතුරු සඳහන් කිරීමත් පිළිබඳව අදළ නියෝගයන් ප්‍රකාශයට පත් කරන ලදි. සමහර වෙළෙඳුන් විසින් පොහොරවල තත්වය බාල කිරීම වැනි අක්‍රමිකතා සිදු කිරීම වැළැක්වීමට පොහොර පිළිබඳ වූ පනත දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට ද අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව වග බලා ගන්නා ලදී. අධීක්ෂණය හා පරීක්ෂණ තුළින් වෙළෙඳ කටයුතු විධිමත් කිරීමට අමතරව, වෙළෙඳ දෙපාර්තමේන්තුව විසින් පොදු මහජනයා මෙන්ම පාසැල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩ සටහන් මාලාවක් සංවිධානය කරන ලදි. අක්‍රියව පැවැති පාරිභෝගික සමිති නැවත ක්‍රියාත්මක තත්ත්වයට ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබූ අතර, 1994 වර්ෂය තුළ නව පාරිභෝගික සමාජ හැත්තෑවක්ද පිහිටුවන ලදි.

ඒකාධිකාරිත්වය, ඒකාබද්ධවීම්, තරඟකාරිත්වයට හානිකර කටයුතු සහ දැනට මිළ පාලනයට යටත් එකම භාණ්ඩ වර්ගය වන ඖෂධ සහ බෙහෙත් ද්‍රව්‍ය සඳහා උපරිම සිල්ලර මිළ නියම කිරීම ආදි කටයුතු වලට අදළ පරීක්ෂණ කටයුතු සාධාරණ වෙළෙඳ කොමිසම විසින්

ක්‍රියාත්මක කරන ලදී. ජීවන වියදම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් පත් කරන ලද කමිටුවක නිර්දේශ මත, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නම් කරන ලද දේශීය වශයෙන් නිපදවන ඖෂධ වර්ග 74 ක්, 1994 පෙබරවාරි සිට බලපාන පරිදි මිළ පාලනයෙන් ඉවත් කරන ලදී. කර්මාන්ත සහා භාවිතා කරන ගෑස් වර්ග සහ ඒ හා සම්බන්ධ නිෂ්පාදිතයන් පිළිබඳව තරඟකාරීත්වයට හානිකර ක්‍රියා පිළිවෙත සාධාරණ වෙළෙඳ කොමිසම විසින් විමසුමට භාජනය කරන ලදී. එවැනි ක්‍රියාවන් නවතා දැමීම සඳහා 1994 වර්ෂය තුළ නියෝග නිකුත් කෙරිණ. බිත්ති ඔරලෝසු සම්බන්ධයෙන් ,භාණ්ඩ වර්ගය පිළිබඳ වෙළෙඳ නාමයන් සාවද්‍ය ලෙස සඳහන් කිරීම පිළිබඳව 1994 වර්ෂය තුළ පරීක්ෂණයන් නිම කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් පාරිභෝගික ආරක්ෂණ පනතේ නියමයන්ට අනුකූලව විධානයන් නිකුත් කරනු පිණිස අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව වෙත කොමිසමේ නිර්දේශ දන්වා යවන ලදී.

වෙළෙඳ ද්‍රව්‍ය මිළදී ගැනීමේ දෙපාර්තමේන්තුව මගින් ජංගම මිළදී ගැනීමේ වැඩපිළිවෙළ යටතේ සහ රබර් වගා කරන ප්‍රදේශවල පිහිටුවා ඇති රබර් මිළදී ගැනීමේ මධ්‍යස්ථාන යටතේ කුඩා රබර් වතු හිමියන්ගෙන් ෂීට් රබර් මිළදී ගැනීමේ කටයුතු තවදුරටත් කරගෙන යන ලදී. සමස්ත ෂීට් රබර් නිෂ්පාදිතයෙන් සුළු ප්‍රතිශතයක් පමණක් මිලදී ගැනීමට දෙපාර්තමේන්තුවේ කටයුතු සීමා වුවද, ජාත්‍යන්තර මිළ ගණන් අනුව යමින් නිෂ්පාදකයන් සඳහා වන මිළ ගණන් දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අතර, එය අනෙකුත් පෞද්ගලික අංශයේ ෂීට් රබර් මිළදී ගන්නන් විසින් අනුගමනය කිරීම නිසා කුඩා රබර් වතු හිමියන්ට සිය නිෂ්පාදිත සඳහා වාසිදයක මිළක් ලබාගැනීමට හැකි විය.

## සංචාරක කර්මාන්තය

1994 වසර තුළ සංචාරක අංශයේ වැඩි දියුණු වූ ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබුණි. මෙම වර්ෂය තුළ පැමිණි මුළු සංචාරක සංඛ්‍යාව වූ 407,511 මෙතෙක් වාර්තාගත වැඩිම සංචාරක සංඛ්‍යාව විය. මෙය 1993 වර්ෂයට වඩා සියයට 4 ක වර්ධනයකි. සංචාරකයින් මෙරට ගතකළ සංචාරක දින ගණන 1994 වසර තුළ සියයට 3 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 4,250,000 ක් විය.

1994 වර්ෂය තුළ සියලුම ප්‍රධාන කලාප වලින් පැමිණි සංචාරක පැමිණීම් වල වර්ධනයක් දක්නට ලැබුණි. බටහිර යුරෝපය සංචාරක පැමිණීම් අතුරින් තවදුරටත් ප්‍රමුඛස්ථානය පවත්වා ගත් අතර, එම කලාපයෙන් පැමිණි සංචාරක සංඛ්‍යාව 1994 වර්ෂයේ මුළු පැමිණීම් වලින් සියයට 62. ක් විය. බටහිර යුරෝපයෙන් පැමිණි මුළු සංචාරක සංඛ්‍යාව 253,899 ක් වූ අතර, එහි සියයට 1 ක සුළු වර්ධනයක් පෙන්නුම් කෙරිණ. එක්සත් රාජධානිය සහ ස්විට්සර්ලන්තයෙන් පැමිණි සංචාරක සංඛ්‍යාවෙහි ඉහළ යාම ජර්මනිය, ප්‍රංශය සහ නෙදර්ලන්තය යන රට වලින් වාර්තා වූ සංචාරක පැමිණීම් වල අඩුවීම මගින් බොහෝ දුරට සමහන් විය. 1994 වර්ෂය තුළ මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 29 ක් නියෝජනය කළ ආසියාව දෙවන වැදගත්ම වෙළෙඳපොළ වූ අතර, ඉන් පැමිණි සංචාරක සංඛ්‍යාව 1993 වර්ෂයට වඩා සියයට 9 ක වර්ධනයක් වාර්තා කළේය. ඉන්දියාව, මැලේසියාව, තායිලන්තය සහ දකුණු කොරියාව යන රටවලින් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව වැඩිවීම මෙයට බොහෝදුරට හේතු විය. මෙපරිද්දෙන්ම, උතුරු ඇමෙරිකාව, නැගෙනහිර යුරෝපය සහ ඕස්ට්‍රලේසියාවෙන් පැමිණි සංචාරක සංඛ්‍යාව පිළිවෙලින් සියයට 15 කින්, සියයට 4 කින් සහ සියයට 2 කින් 1994 වර්ෂය තුළ වර්ධනය විය.

සංචාරක කර්මාන්තයෙන් ලත් දළ ඉපැයීම් ප්‍රමාණය 1994 වසරේදී රුපියල් දශලක්ෂ 11,375 (විගැහි දශලක්ෂ 161) ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1993 වසරට වඩා සියයට 10ක (රුපියල් වටිනාකම අනුව සියයට 16ක) වර්ධනයක් පෙන්නුම් කරයි.

1994 වර්ෂයෙහි සංචාරක කර්මාන්තයෙහි මුළු සේවා නියුක්තිය පෙර වසරට වඩා සියයට 11ක වර්ධනයක් පෙන්නුම් කරමින් 84,154 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙය 35,064 ක් වූ සෘජු සේවා නියුක්තියකින් සහ 49,090 ක් වූ අනුබද්ධ අංශයන්හි අනියම් සේවා නියුක්තියකින් ද සමන්විත විය.

වර්ගීකරණිත නවතැන් අංශයේ හෝටල් සංඛ්‍යාව 1993 වර්ෂයේ දී 129 සිට 1994 වර්ෂයේ දී 134ක් දක්වා ඉහළ නැගිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුළු හෝටල් කාමර උපයෝජනය මෙම වසර දෙක අතර 10,365 සිට 10,942 ක් දක්වා වැඩිවිය. එසේ වුවද, මෙම අංශයේ වාර්ෂික කාමර උපයෝජන අනුපාතය 1993 වර්ෂයෙහි වූ සියයට 57 සිට 1994 වර්ෂයේ දී සියයට 56.6 ක් දක්වා සුළු වශයෙන් අඩුවිය. අනුබද්ධිත නවාතැන් අංශයේ ඒකක සංඛ්‍යාව 1993 වර්ෂයේ දී පැවති 140 සිට 1994 වර්ෂයේදී 169 ක් දක්වා සියයට 21 කින් ඉහළ නැගුණි.

සංචාරකයින් පැමිණීමේ අරමුණු මත පදනම් වූ වර්ගීකරණයක් අනුව බලන විට, විනෝදාශ්වාදය සඳහා පැමිණි සංචාරක සංඛ්‍යාව සියයට 3 ක සුළු අඩුවීමක් පෙන්නුම් කළ අතර, ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණි සංචාරක සංඛ්‍යාව 1993 වර්ෂයේ දී 4,089 සිට 1994 වර්ෂයේ දී 21,340 දක්වා වැඩිවෙමින් කැපී පෙනෙන වර්ධනයන් වාර්තා කළේය.

සංචාරකයින් පැමිණි ප්‍රවාහන මාධ්‍ය පදනම අනුව සලකන විට නිශ්චිත ගමනාන්ත සහිත ගුවන් යානා මගින් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සියයට 9 කින් වැඩි වූ අතර, එය, අන්තර් කලාපීය ගුවන් යානා මගින් පැමිණි සංඛ්‍යාවෙන් සියයට 8 ක් සහ කලාප ඇතුළත ගුවන් යානා වලින් පැමිණි සංඛ්‍යාවෙහි වූ සියයට 14 ක ඉහළ නැගීම් වලින් සමන්විත විය. මෙම වසර දෙක අතර එයාර් ලංකා ගුවන් සේවය මගින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාවෙහි සියයට 6 ක පහත වැටීමක් දක්නට ලැබිණ.

## 1.51 සංඛ්‍යා සටහන
## 1993 - 1994 සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛණ

| ශීර්ෂය | 1993 | 1992 ට වඩා ප්‍රතිශත වෙනස | 1994(අ) | 1993 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් | 392,250 | - 0.4 | 407,511 | + 3.9 |
| 2. කලාප අනුව පැමිණි ගණන | 256,158 | + 2.4 | 258,285 | + 0.8 |
| 2.1 යුරෝපය | | | | |
| 2.1.1 ප්‍රංශය | 34,779 | - 13.5 | 30,522 | - 12.2 |
| 2.1.2. ජර්මනිය | 95,430 | + 11.7 | 93,528 | - 2.3 |
| 2.1.3 ඉතාලිය | 18,267 | - 28.6 | 18,069 | - 1.1 |
| 2.1.4 එක්සත් රාජධානිය | 42,474 | + 22.6 | 47,766 | + 12.4 |
| 2.1.5 වෙනත් | 65,208 | + 1.6 | 68,400 | + 4.9 |
| 2.2 උතුරු ඇමෙරිකාව | 13,635 | + 8.1 | 15,612 | + 14.5 |
| 2.2.1 කැනඩාව | 4,062 | - 1.0 | 4,920 | + 21.1 |
| 2.2.2 ඇමෙරිකා එක්සත් ජනපදය | 9,573 | + 12.5 | 10,692 | + 11.7 |
| 2.3 ආසියාව | 106,668 | - 6.6 | 116,352 | + 9.1 |
| 2.3.1 ජපානය | 20,421 | - 29.1 | 19,497 | - 4.5 |
| 2.3.2. ඉන්දියාව | 32,433 | + 25.0 | 44,142 | + 36.1 |
| 2.3.3 පකිස්ථානය | 12,369 | + 7.7 | 10,188 | - 17.6 |
| 2.3.4 හොංකොං | 4,119 | - 50.8 | 4,302 | + 4.4 |
| 2.3.5 වෙනත් | 37,326 | - 5.7 | 38,223 | + 2.4 |
| 2.4 ඔස්ට්‍රලේෂියාව | 11,823 | - 4.4 | 12,033 | + 1.8 |
| 2.4.1 ඔස්ට්‍රේලියාව | 10,242 | - 6.8 | 9,681 | - 5.5 |
| 2.4.2 නවසීලන්තය | 1,086 | - 6.5 | 1,323 | + 21.8 |
| 2.4.3 වෙනත් | 495 | + 139.1 | 1,029 | + 107.9 |
| 2.5 වෙනත් කලාප | 3,966 | - 11.7 | 5,229 | + 31.8 |
| 3. පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | 392,250 | - 0.4 | 407,511 | + 3.9 |
| 3.1 විනෝදය | 387,141 | + 3.7 | 377,537 | - 2.5 |
| 3.2 ව්‍යාපාරික කටයුතු | 4,089 | - 73.6 | 21,340 | + 421.9 |
| 3.3 වෙනත් | 1,020 | - 79.4 | 8,634 | + 746.5 |
| 4. සංචාරක දින (රාත්‍රි) ගණන (දහස්) | 4,148 | + 2.5 | 4,250 | + 2.5 |
| 5. පැය 24 ට අඩු කාලයකට රටතුල රැඳෙන විදේශික මගීන්ගේ පැමිණීම | 6,093 | + 7.8 | 8,413 | + 38.1 |
| 6. මූලාශ්‍ර අනුව සංචාරකයින්ගේ දළ ලැබීම් (රුපියල් දශලක්ෂ) (අ) | 9,815 | + 11.0 | 11,375 | + 15.9 |
| 7. මුළු සේවා නියුක්තිය | 75,710 | + 8.5 | 84,154 | + 11.2 |
| 7.1 සෘජු | 30,710 | + 4.2 | 35,064 | + 14.2 |
| 7.2 වක්‍ර | 45,000 | + 11.6 | 49,090 | + 9.1 |

(අ) තාවකාලික.

මූලයන් : ලංකා සංචාරක මණ්ඩලය,
ශ්‍රී ලංකා මහ බැංකුව.